බී -1

ඉ.අ. 1
යොමු අංකය :

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් වෙත,

**ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය)**
**යටතේ ..................................................**
**...................................... සඳහා .............................**
**අමාත්‍යාංශයට / දෙපාර්තමේන්තුවට ඉඩමක් අත්කර ගැනීම සඳහා ඉල්ලුම් පත්‍රය***

01. මෙයට අමුණා ඇති විස්තර ප්‍රකාශයේ සඳහන් ඉඩම/ඉඩම් පොදු කාර්යයක් සඳහා ප්‍රයෝජනයට ගැනීම පිණිස ....................................................අමාත්‍යාංශයේ /දෙපාර්තමේන්තුවට අත්කර ගැනීමට අවශ්‍යව ඇත.

02. මෙම ඉඩම ඉහතින් සඳහන් කළ අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ කටයුතු සඳහා යොදා ගැනීමට රජයට අත්පත් කර ගැනීම මු.රෙ. 53 යටතේ අයවැය අධ්‍යක්ෂ විසින් අනුමත කර ඇත. එම ලිපියේ පිටපතක් මෙයට යාකර එවමි.

03. මෙම අත්කර ගැනීම සඳහා ඇස්තමේන්තු කරන ලද මුළු පිරිවැය රු. ..................................... ක් වේ. එම මුදල ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ සාමුහික වැය ශීර්ෂයෙන් දැරීම සම්බන්ධව මහා භාණ්ඩාගාරයේ අයවැය අධ්‍යක්ෂගේ අනුමැතිය ඔහුගේ අංක : .................................. සහ ...................... දිනැති ලිපියෙන් ලබා දී ඇත. එම ලිපියේ ඡායා පිටපතක් මෙයට අමුණා ඇත.

04. මේ සඳහා වන පිරිවැය ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ වැය ශීර්ෂයෙන් දරනු නොලබන්නේ නම් වන්දි ගෙවනු ලබන්නේ කුමන වැය ශීර්ෂයක් යටතේද යන්න සඳහන් කරන්න.

05. ඉඩම අත්කර ගැනීමේ පණත යටතේ අත්කර ගැනීම සඳහා වන අනෙකුත් වියදම් (පුවත්පත් දැන්වීම්, මිනුම් ගාස්තු ආදිය) ..............................................................................................න් අය කර ගත යුතුය. (ආයතනය සඳහන් කරන්න.)

06. මෙය පරිත්‍යාගයකි. පරිත්‍යාග කරන පුද්ගලයා විසින් නොතාරිස්වරයකු ලවා සහතික කර ඇති තෑගි ඔප්පුවේ පිටපතක් මෙයට අමුණා ඇත. අත්පත් කර ගැනීමෙන් බලාපොරොත්තු වන්නේ මෙම පරිත්‍යාගය විධිමත් ලෙස නියමානුකූල කිරීමය.

07. ඉඩම අත්කර ගැනීමේ කටයුතු සඳහා පිඹුරුපත් පිළියෙල කිරීම සහ සෙසු පරීක්ෂණ කටයුතුවලදී ඉඩමේ මායිම් පෙන්වා දීම සඳහා පහත සඳහන් නිලධාරියා නම් කරනු ලැබේ.

(අ) නිලධාරියාගේ නම :

(ආ) තනතුර :

(ඇ) ලිපිනය :

........................................................
ලේකම්

දිනය : ........................................ අමාත්‍යාංශය

---

* අමාත්‍යාංශයක හෝ දෙපාර්තමේන්තුවක පොදු කටයුත්තක් සඳහා ඉඩම් අත්කර ගැනීමේ අවශ්‍යතාවකදී භාවිතා කිරීම සඳහා

(උපදෙස් සඳහා පසුපිට බලන්න.)

# අත්කර ගැනීමේ පිළියෙල කිරීමේදී
# විශේෂයෙන් සැලකිය යුතු කරුණු

01. යෝජනාව කට්ටල 03 කින් ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයට එවීම.

02. එම යෝජනාවට අයදුම්පත, විස්තර පත්‍රිකාව හා අදාළ ඉඩම පෙන්නුම් කරන මැනුම් පිඹුරක් හෝ කටු සැලැස්මක් ඇතුලත් වීම. ව්‍යවස්ථාපිත ආයතනයක් සඳහා අත්කර ගැනීමක් නම් එම ආයතනය සංස්ථාපිත පණතේ විධිවිධාන පරිදි පළකරන ලද ගැසට් නිවේදනයෙහි පිටපතක් ද, ප්‍රාදේශීය සභාවක් සඳහා අත්කර ගැනීමක් නම් එම සභාවේ සම්මුතිය දැක්වෙන සහතිකය ද අමුණා තිබීම.

03. විස්තර ප්‍රකාශයේ ඉඩම පිළිබඳ සඳහන් වන කරුණු (ප්‍රමාණය, කැබලි අංක, මායිම් ආදිය) අමුණා ඇති පිඹුරේ හෝ කටු සිතියමේ දැක්වෙන තොරතුරු සමග එකිනෙක ගැලපීම.

04. අයදුම්පතෙහි නියමිත ස්ථානයෙහි ඉඩමේ ඇස්තමේන්තු ගත මුදලද ඊට වැඩිවිය හැකි මුදල ද, අනෙකුත් වියදම් ද ගෙවනු ලබන ආයතනයේ නම සඳහන් කිරීම.

05. රජයේ අමාත්‍යාංශයක/දෙපාර්තමේන්තුවක අවශ්‍යතාවයක් සඳහා නම් වන්දි හා අනෙකුත් වියදම්, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ සාමූහික ප්‍රතිපාදන අතුරින් දැරීම පිණිස මු.රෙ. 53 යටතේ අයවැය අධ්‍යක්ෂගේ අනුමැතිය ලබාගෙන, ඒ බව අයදුම්පතේ සඳහන් කිරීම.

06. පළාත් සභාවක්, ප්‍රාදේශීය සභාවක්, සංස්ථාවක්, මණ්ඩලයක් වැනි ආයතනයක් සඳහා නම්, ඇස්තමේන්තුගත මුදලින් 25% හෝ රු. 50,000/- යන දෙකෙන් වැඩි මුදල් අත්තිකාරමක් වශයෙන්ද, අනෙකුත් වියදම් සඳහා ප්‍රමාණවත් මුදලක්ද, ඉඩම පිහිටි කොට්ඨාශයේ ප්‍රාදේශීය ලේකම් වෙත තැන්පත් කර, ඒ බව අයදුම්පතේ සඳහන් කර තිබීම.